ගම්පහ ප්‍රාදේශීය සභාව

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2027 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ, සේවාවන් සැපයීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත් කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පිළිගත් සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව 2026.11.20 දින දක්වා මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

1. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අය විසින් පහත සඳහන් විස්තරද ඇතුලත්ව සකස් කරගත් අයදුම්පත් 2026.11.20 දින හෝ ඊට ප්‍රථම "සභාපති, ගම්පහ ප්‍රාදේශීය සභාව, මිරිස්වත්ත, මුදුන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ලැබෙන සේ එවිය හැකිය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2027" යනුවෙන් සඳහන් කළ යුතුය.

   I. භාණ්ඩ / සේවා සැපයුම්කරුවන්ගේ, කොන්ත්‍රාත්කරුවන්ගේ නම හා ලිපිනය
   II. දුරකථන / ෆැක්ස් අංකය, ඊමේල් ලිපිනය
   III. ලියාපදිංචිය අපේක්ෂා කරන සැපයුම් / සේවාවේ අංකය හා නම (උපලේඛනය අනුව)
   IV. ණය පහසුකම් පිළිබඳ විස්තරය (ණය ප්‍රමාණය හා කාලය)
   V. ව්‍යාපාර වෙළඳ නාමය හා ලිපිනය
   VI. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය
(ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)
   VII. පළපුරුද්ද පිළිබඳ විස්තර
   VIII. ඉදිකිරීම් හා අළුත්වැඩියා ක්ෂේත්‍රයේ ලියාපදිංචිය පිළිබඳ විස්තරය
(එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

- එක් එක් සැපයුම් හා සේවාවන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.
- **අපේක්ෂිත සැපයුම් හා සේවාවන් පිළිබඳ උපලේඛනය හා ආදර්ශ අයදුම්පත www.gampaha.ps.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.**

2. උපලේඛනයේ දක්වා ඇති ලියාපදිංචි ගාස්තුව මුදලින් හෝ "සභාපති, ගම්පහ ප්‍රාදේශීය සභාව" නමට ලියන ලද චෙක්පතක් මගින් හෝ ගෙවීම් කළ හැක. (මේ සඳහා මුදල් ඇණවුම් බාරගනු නොලැබේ)
3. කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අය විසින් තමන්ගේ යෝග්‍යතාවය ලිඛිත සාක්ෂි මගින් තහවුරු කළ යුතුය.
4. බස්නාහිර පළාත තුල සිටින සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

2026.10.13 වන දින

ගම්පහ ප්‍රාදේශීය සභාවේ දීය

දුරකථන අංක 033 2222020

බී. ඩී සෙනරත් පීරිස්

සභාපති,

ගම්පහ ප්‍රාදේශීය සභාව.

ගම්පහ ප්‍රාදේශීය සභාව

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් , සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

ආදර්ශ අයදුම්පත්‍රය

1.	භාණ්ඩ / සේවා සැපයුම්කරුගේ, කොන්ත්‍රාත්කරුගේ නම හා ලිපිනය	
2.	දුරකථන අංකය WhatsApp No ෆැක්ස් අංකය ඊමේල් ලිපිනය	
3.	ලියාපදිංචිය අපේක්ෂා කරන සැපයුම් /සේවාවේ අංකය හා නම (උපලේඛනය අනුව)	
4.	ණය පහසුකම් පිළිබඳ විස්තරය (ණය ප්‍රමාණය හා කාළය)	
5.	ව්‍යාපාර වෙළඳ නාමය හා ලිපිනය	
6.	ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)	
7.	පළපුරුද්ද (කලින් සැපයුම්/ සේවාවන් කල ආයතන) පිළිබඳ විස්තර	
8.	ඉදිකිරීම් හා අළුත්වැඩියා ක්ෂේත්‍රයේ ලියාපදිංචිය පිළිබඳ විස්තරය (එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)	

ඉහත සඳහන් විස්තර සත්‍ය වන අතර, ඔබ ආයතනයේ සැපයුම්කරුවකු / කොන්ත්‍රාත්කරුවකු/ සේවා සපයන්නෙකු වශයෙන් ලියාපදිංචි කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

....

දිනය: සැපයුම්කරු / කොන්ත්‍රාත්කරු/ සේවා සපයන්නා ගේ අත්සන හා මුද්‍රාව